# විශේෂ නිවේදනයයි.

## ඊශ්‍රායලයේ වාසය කරන සියලුම ශ්‍රී ලාංකිකයන් වෙත

### කොවිඩ්-19 අරමුදල (ඉටුකම අරමුදල) සඳහා පරිත්‍යාග

මෙම තානාපති කාර්යාලය විසින් ඉහත කරුණ සම්බන්ධයෙන් මීට පෙර සිදුකරන ලද දැනුවත් කිරීමට අමතර වශයෙනි.

ශ්‍රී ලංකාවේ ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන කොවිඩ්-19 සෞඛ්‍යාවරණ හා සමාජ ආරක්ෂණ අරමුදල (ඉටුකම අරමුදල) වෙනුවෙන් මූල්‍යමය දායකත්වය සැපයීමට කැමති විදේශ ගත ශ්‍රී ලාංකිකයන්හට ඒ සඳහා පහත දැක්වෙන පහසුකම් සලසා ඇති බව විදේශ අමාත්‍යාංශය විසින් මෙම තානාපති කාර්යාලය දැනුවත් කර ඇති බව මෙයින් ඔබවෙත කාරුණිකව දැනුම් දෙමු.

- ඊශ්‍රායලයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය යටතේ පවතින රජයේ පොදුතැන්පත් ගිණුම වෙත මුදල් තැන්පත් කිරීම මගින් හෝ
- ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන පහත සඳහන් කොවිඩ්-19 සෞඛ්‍යාවරණ හා සමාජ ආරක්ෂණ අරමුදල වෙත සෘජුවම මුදල් තැන්පත් කිරීම මගින්

| | |
|---|---|
| **Account Name** | - COVID 19 HEALTH CARE AND SOCIAL SECURITY FUND |
| **Account No** | - 85737373 |
| **Bank Name** | - Bank of Ceylon |
| **Bank Code** | - 7010 |
| **Branch Name** | - Corporate Branch |
| **Branch Code** | - 660 |
| **Swift Code** | - BCEYLKLX |
| **Correspondent Agent** | - Bank of Ceylon |

තානාපති කාර්යාලය යටතේ පවතින රජයේ පොදු තැන්පත් ගිණුම වෙත තැන්පත් කරණු ලබන මුදල් පරිත්‍යාග වෙනුවෙන් තානාපති කාර්යාලය විසින් මුදල් ලද බව සනාථ කෙරෙන ලදුපතක් නිකුත් කරනු ලබන අතර එම මුදල් පරිත්‍යාග විදේශ අමාත්‍යාංශයට යොමුකරනු ලැබේ. විදේශ අමාත්‍යාංශය මගින් තැන්පත්කරුගේ මුදල් පරිත්‍යාග ඉහත අරමුදල වෙත බැරකල පසු එම මුදල අරමුදලට ලද බවට කොවිඩ්-19 අරමුදල වෙතින් තැන්පත්කරු වෙත දැනුම්දීම අපේක්ෂා කරන්නේනම් තැන්පත්කරු වෙත විදේශ අමාත්‍යාංශයේ කොවිඩ්-19 අංශය විසින් ලිපියක් නිකුත් කරනු ලබන බවද දැනුම්දී ඇත.

තවද, තැන්පත්කරුවන් විසින් සෘජුවම ඉහත බැංකු ගිණුම හරහා මුදල් පරිත්‍යාග සිදු කරන්නේනම් තැන්පත්කරු විසින් මුදල් බැරකරන ලද රිසිට්පතහි පිටපතක් විදේශ අමාත්‍යාංශයේ කොවිඩ්-19 අංශය වෙත මෙම තානාපති කාර්යාලය හරහා යැවීමෙන් පසු කොවිඩ්-19 අරමුදල විසින් නිකුත්කරනු ලබන තැන්පත්කරුගේ මුදල් අදාල ගිණුමට ලද බව තහවුරුකෙරෙන ලිපිය හා රිසිට්පත විදේශ අමාත්‍යාංශය විසින් තානාපති කාර්යායල හරහා තැන්පත්කරු වෙත එවනු ලැබේ.

ප්‍රමාණයෙන් විශාල මුදල් පරිත්‍යාග විදේශ ලේකම් සහ කොවිඩ්-19 අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරීගේ සහභාගිත්වයෙන් විදේශ අමාත්‍යාංශයේදී භාරදීම සිදුකළ හැකි බවද විදේශ අමාත්‍යාංශය විසින් වැඩිදුරටත් දන්වා ඇත.

එසේම, මෙම අරමුදල හි කාර්යයන්, මුදල් භාවිත වන ආකාරය හා මුදල් වැයකිරීම් සම්බන්ධයෙන් වත්මන් තොරතුරු ආදී වැඩිදුර විස්තර www.itukama.lk යන වෙබ් අඩවියෙන් ලබාගත හැකි බවද ඔබ වෙත කාරුණිකව දැනුම්දෙමු.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ටෙල්අවිව්,ඊශ්‍රායලය
2021.10.25